# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/18 – 2022 දෙසැම්බර් මස 13 වැනි අඟහරුවාදා – 2022.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/20.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. පී. සිසිර මයා, 316/ඒ, බියගම පාර, පට්ටිය, කැළණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිවඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4 හි නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

1A – G 38309 – 14 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2021/20.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. පී. සිසිර මයා, 316/ඒ, බියගම පාර, පට්ටිය, කැළණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

'' පී. සිසිර මහතා සම්බන්ධයෙන් ගන්නා ලද විනය ක්‍රියාමාර්ගයේ දී ඔහුට ලබාදුන් විනය නියෝගය මගින් වැඩ තහනම් කර සිටි 2018.10.29 දින සිට 2019.03.04 දින දක්වා කාලයට වේතන අහිමි කිරීම තුළින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12-0147

---

මගේ අංකය: IR/COM/04/2021/68.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. අන්තර් සමාගම් සේවක සංගමය, නො. 10, නගර සභා පටුමඟ, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කොකා- කෝලා බෙවරේජස් ශ්‍රී ලංකා ලිමිටඩ්, තේක්කවත්ත, බියගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහරගම, නාවින්න, ශ්‍රී දේවානන්ද පාර, අංක 33, හි නීතිඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/04/2021/68.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, නො. 10, නගර සභා පටුමග, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කොකා- කෝලා බෙවරේජස් ශ්‍රී ලංකා ලිමිටඩ්, තේක්කවත්ත, බියගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''කොකා-කෝලා බෙවරේජස් ශ්‍රී ලංකා ලිමිටඩ් ආයතනයේ සේවය කරන 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට් ලයින් කන්ට්‍රෝලර් තනතුරට පත් කර ඇති කේ. ඩබ්. කේ. චන්දිම මයා ඇතුළු උපලේඛනයේ නම් සඳහන් සේවකයින් 18 දෙනාගේ සේවා ගිවිසුමෙහි සඳහන් කර ඇති පරිදි අවුරුදු එකහමාරක කාලයකින් උසස් වීම් හිමි ද, හිමි නම් හිමි තනතුර හා වරප්‍රසාද මොනවා ද යන්න පිළිබඳව වේ.''

1. කේ. ඩබ්. කේ. චන්දිම
2. ජී. කේ. හරිඳු
3. ගාමිණී සෙනරත්
4. ආර්. එම්. ජී. එම්. රාජපක්ෂ
5. ආර්. ඒ. වීරසිංහ
6. සම්පත් විජේතුංග
7. පී. එච්. ජේ. පී. ලසන්ත
8. එච්. සී. ඉෂාර
9. එච්. එම්. ඒ. එන්. කේ. හෙන්නායක
10. ආර්. වී. චමින්ද
11. එන්. ටී. යූ. නෙලුවතුඩුව
12. එම්. පී. එස්. එස්. මදනායක
13. ඒ. ඩී. කේ. සෙනෙවිරත්න
14. කේ. ඩී. යූ. ප්‍රසන්න
15. එන්. ඒ. කේ. පී. එස්. තිලකසිරි
16. කුමාර කරුණාරත්න
17. ජේ. එල්. ආර්. ජයකොඩි
18. ජේ. ඒ. එස්. නිවන්ත

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12-0148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.